---

## කටුනායක-සීදූව නගර සභාව
## ගම්පහ දිස්ත්‍රික්කය

1.. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 ජූනි 26 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 මාර්තු 26 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කටුනායක-සීදූව නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව **මම** මතයක් ප්‍රකාශ **නොකරමි.**

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම් කරණ ප්‍රතිපත්ති අනුව සියලුම ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම් තබා ඇති බව දක්වා තිබුනද, ස්ථාවර තැන්පතු පොලී ආදායම් වෙනුවෙන් මුදල් පදනම අනුගමනය කර තිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය **කරනු ලැබේ.**

(අ) සමාලෝචිත වර්ෂයට අදාල කෙරගෙන යන කර්මාන්ත වෙනුවෙන් ගෙවිය යුතු ප්‍රාග්ධන වියදම් ගිණුම් ගත කිරීමේදී ප්‍රාග්ධන වියදම් ගිණුම හරකර නොතිබුණ අතර, ණය හිමි ගිණුම බැරකර තිබුණි.

(ආ) ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර අදාල උපලේඛණය අනුව රු.7,016,331 ක් වුවත්, ජර්නල් සටහන් අංක 28 මගින් ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ලෙස රු.15,475,261 ක් අදාල ගිණුම හරකර තිබූ අතර, ප්‍රාග්ධන ආධාර ගිණුමට බැරකර තිබුනේ රු.16,475,261 ක් ලෙසය.

---

**(ඇ)** මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී ලැබූ ප්‍රාග්ධන ආධාර වටිනාකම රු.17,648,279 ක් වුවත්, අදාල උපලේඛණ අනුව එය රු.10,354,308 ක් විය.

(ඈ) දේශීය ණය **හා** සංවර්ධන අරමුදලින් එක් එක් ව්‍යාපෘති සඳහා ලබාගත් ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී පොලී ලෙස රු.2,080,840 ක් ගෙවා ඇතත්, එය පොලී ගිණුමට හර කරනු වෙනුවට එය ගෙවිය යුතු පොලී ගිණුමට හරකිරීම හේතුවෙන් ගෙවිය යුතු ණය පොලී ගිණුමේ රු.1,072,129 ක හර ශේෂයක් විය.

(ඉ) වැසි ජල අපවහන ව්‍යාපෘතිය සඳහා දේශීය ණය **හා** සංවර්ධන අරමුදලේ ගෙවිය යුතු ණය ගිණුමට රු.1250,075 ක් හරකර ඇති අතර, ඒ වෙනුවෙන් බැර සටහනක්ද නොතිබුණු අතර, ඒ පිළිබඳ විස්තර **දක්වා නොතිබුණි.** සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු ණය වාරිකය හා පොලිය වූ රු.318,098 ක් ණය ගිණුම හර කර ගෙවිය යුතු ණය හා වාරික පොලී ගිණුම බැරකර ඇත අතර, නැවතත් දේශීය ණය **හා** සංවර්ධන ණය ගිණුමට රු.150,075 ක් හරකර තිබුණි.

(ඊ) සාරාංශ ආදායම් ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයේ වරිපනම් ලැබීම් රු.59,243,990 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති උපලේඛණය අනුව එය රු.61,983135 ක් විය.

(උ) ජර්නල් සටහන් අංක 07 මගින් සමාලෝචිත වර්ෂයේ වරිපනම් සඳහා දුන් වට්ටම් වටිනාකම රු.3,606,893 ක් දුන් වට්ටම් ගිණුම හර හා හිඟ හිටි වරිපනම් ගිණුම බැර ලෙස දක්වා ඇතත්, ගිණුම්වල එම වටිනාකමින් දුන් වට්ටම් සටහන් කර නොතිබුණි.

**(ඌ)** සමාලෝචිත වර්ෂයේ මුද්දර ආදායම රු.7,130,995 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.16,846,759 ලෙස දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ ලැබූ මුද්දර ආදායම රු.7,130,995 වැරදීමකින් දෙවරක් මුද්දර ආදායම් ගිණුම හා ලැබිය යුතු මුද්දර ආදායම් ගිණුමට බැරවී තිබුණු අතර, ලැබිය යුතු මුද්දර ආදායම රු.15,000,000 ක් දෙවරක් සටහන් කර තිබුණි.

(ඒ) විවිධ තැන්පතු ලෙජර් ගිණුමේ තැන්පතු ලැබීම් ලෙස රු.13,206,902 ක් වුවත්, කාණ්ඩ එකතු ලේඛණය අනුව ලැබීම් රු.11,859,797 කි. මේ අනුව රු.1,347,105 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය අවසානයේ අතැති මුදල් රු.423,102ක් බැංකු ශේෂය ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2013 මැයි 30 දින වන විට විගණන විමසුම් 10 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.6,798,538 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.271,085,752 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාලව ශේෂයන්ගේ එකතුව රු.98,018,704 ක් වූ අතර, ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තා අනුව ශේෂයන්ගේ එකතුව රු.85,851,869 ක් විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,096,608 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 50,626,799 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය **කරනු ලැබේ**

**(අ)** පුස්තකාල ව්‍යාපෘතිය සඳහා 2009 අගෝස්තු 11 දින රු.18,058,218 ක ණය මුදලක් දේශීය ණය **හා** සංවර්ධන අරමුදලෙන් ලබාගෙන **තිබුණි.** 2011 සැප්තැම්බර් 30 දින සිට වාරික මුදල් ගෙවිය යුතු වුවත්, කිසිදු ණය වාරිකයක් **ගෙවා** නොතිබුණි.

---

**(ආ)** වැටුප් හා අතිකාල ගෙවීම සඳහා බැංකුවෙන් මුදල් රැගෙන ඒම සඳහා ආරක්ෂිත වැඩ පිළිවෙලක් සභාවේ අනුගමනය කර නොතිබුණි.

(ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ 1995 මාර්තු 09 දිනැති **අංක** එල්ජ්ඩී/95/04 **දරන** චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර තැන්පතු මුදල් කරගැනීමේදී පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, රු.15,000,000 ස්ථාවර තැන්පතු 06 ක් මුදල් කරගැනීමේදී අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 139 (10) ප්‍රකාරව චෙක්පත් මගින් ගෙවීම් සඳුකිරීමේදී බැංකු ශේෂය සියලුම් ගෙවීම් පියවා ගැනීමට ප්‍රමාණවත් බව තහවුරු කරගත යුතු වුවත්, එසේ නොකිරීම නිසා 2012 **දෙසැම්බර්** 31 දිනට මුදල් පොතේ රු.1,892,056 ක සෘණ ශේෂයක් විය.

(ඉ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාස 485 (4) ප්‍රකාරව ස්ථාන මාරුවී ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.96,778 ක ණය මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුනරාවර්තන වැය ශීර්ෂ 38 ක රු.34,760,135 **ක්** ද, ප්‍රාග්ධන වැය විෂයයන් 03 ක රු.2,784,046 ක් ද **ප්‍රතිපාදන** ඉක්මවා වියදම් කර තිබුනද, ඒ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.3. ආදායම් පරිපාලනය

---

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

---

**සභාපතිවරයා විසින්** සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්ත මේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 55,701 | 58,595 | 71,081 |
| (ii) | බදු කුලී | 8,251 | 10,855 | 956 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,066 | 2,791 | 852 |
| (iv) | වෙනත් ආදායම් | 27,116 | 33,296 | 2,833 |

2.3.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**(අ)** පළාත් පාලන කොමසාරිස්ගේ 2003 පෙබරවාරි 15 දිනැති **අංක** එල්/පී/3/2003 **දරන** චක්‍රලේඛයේ 3.6 ඡේදය ප්‍රකාරව වර්ෂයකට අදාලව උසාවි දඩ මුදල්, මුද්දර ගාස්තු, පළාත් සභා ආධාර හා විමධ්‍යගත ආධාර **පිළිබඳව** පුරෝකථනය කළ නොහැකි බැවින්, එවැනි ආදායම් ලැබෙන වර්ෂයේදී එම වර්ෂයට අදාලව ගතයුතු බව දක්වා ඇතත්, ඊට පටහැනිව 2012 වර්ෂය වෙනුවෙන් මුද්දර ආදායම රු.15,000,000 ක් ලෙස ඇස්තමේන්තු කර ගිණුම් ගතකර තිබුණි.

(ආ) ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2007 වර්ෂයේ සිට ද කොළඹ කාර්යාලයේ 2010 වර්ෂයේ සිටද ලැබිය යුතු මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 වරිපනම් බදු

**(අ)** නගර සභා ආඥා පනතේ 170 ප්‍රකාරව හිඟ හිටි වරිපනම් රු.71,081,495 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**(ආ)** නගර සභා ආඥා පනතේ 160, 161 ප්‍රකාරව අනුමැතියකින් තොරව රු.140,337 ක වරිපනම් නිදහස් කිරීම් හා කපාහැරීම් කර තිබුණි.

---

**(ඇ)** අනුකූලතා සහතික ලබාගත් ඉඩම්වල වර්පනම් බදු සංශෝධනය සිදුවී නොමැති බව නිරීක්ෂණය විය.

2.3.4 වෙනත් ආදායම්

පළාත් පාලන කොමසාරිස්ගේ 88/20 හා 1988 අප්‍රේල් 20 දිනැති චක්‍රලේඛය ප්‍රකාර, අයවීමට ඇති හිඟ හිඟ වෙනත් ආදායම් පිළිබඳ චක්‍රලේඛය අනුව කාල ප්‍රකාශයක් චක්‍රලේඛයේ දැක්වෙන ආකෘතිය ප්‍රකාරව සකස් කර, යටත් පිරිසෙයින් තුන් මාසයකට වරක්වත් සභාවට ඉදිරිපත් කිරීමෙන් පවත්නා තත්ත්වය සභාවේ දැනගැනීමට සැලැස්විය යුතු වුවත්, හිඟහිඟ වෙනත් ආදායම් රු..4,641,179ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

**ඉකුත්** වර්ෂවලට අදාලව අයවිය යුතු මල බැහැර කිරීමේ ගාස්තු රු.160,893 ක්ද, විනෝද බදු රු.276,000 ක්ද, කසල බදු රු.1,937,887 ක් අය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.5 බලපත්‍ර ගාස්තු

පසුගිය වර්ෂ දෙකකට පෙර ලැබිය යුතු බලපත්‍ර ගාස්තු රු.852,000 ක් හා විනෝද බදු රු.1,937,886 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.6 බදු කුලී

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත බදුකුලී ආදායම රුපියල් මිලියන 03 කින් හා වෙනත් ආදායම් රුපියල් මිලියන 09 කින් අඩුවෙන් ඇස්තමේන්තු කර තිබුණි.

2.3.7 කඩ කාමර බදු

**(අ)** සීදූව නව වෙළඳ සංකීර්ණයේ මුල් සැලැස්මට අමතරව ඉදිකර තිබූ කඩ කාමර 14 කින් සමන්විත දෙමහල් වෙළඳ සංකීර්ණය ප්‍රධාන මාර්ගයට මුහුණලා පිහිටා නොතිබීම නිසා, මේ වනවිට එකම කඩ කාමරයක්වත් බදු දීමට නොහැකිව තිබුණි.

**(ආ)** සතොස ආයතනයට ලබාදී තිබූ කඩකාමර 05 න් බදු ගිවිසුමේ අංක 4 වගන්තිය ප්‍රකාරව, ගෙවිය යුතු දඩ මුදල් රු.3,889,982 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

---

**(ඈ)** ලක් සතොස ආයතනයේ අලෙවි සැලේ කඩකාමර ලක් සතොස ආයතනයේ අවශ්‍යතාවය මත වෙනස් කිරීම් සඳහා දැරූ වියදම රු.597,196 ක මුදල ආරක්ෂිත ඇප තැන්පතුවක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

2.3.8 බලපත්‍ර ගාස්තු

------------------

**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ** ලියාපදිංචි නොවූ හෝටල් වලින් හා ලැගුම්හල් වලින් බදු අයකිරීම සම්බන්ධයෙන් 2012 ජනවාරි 31 දිනැති ගැසට් පත්‍රය මගින් නියම කර තිබු**ණි.** ආයෝජන ප්‍රවර්ධන කලාපයක් හා විශාල නාගරීකරණය වූ බල ප්‍රදේශයක් වූ නගර සභා සීමාව තුළ ලැගුම්හල් හා හෝටල් වලින් ආදායම් අයකර ගැනීමට අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර තිබියදීත්, ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.9** ඝන අපද්‍රව්‍ය අපහරණ ගාස්තු

----------------------------------

2008 ජුලි 30 දිනැති අංක 1560/6 ගැසට් පත්‍රයේ පළකර ඇති 2008 අංක 01 දරණ ඝන අපද්‍රව්‍ය කළමණාකරණ රීති **අනුව අයකළ යුතු ආදායම් අයකරගෙන නොතිබුණි.**

(අ) රීති මාලාවේ අංක 18(1) අනුව අදාළ පළාත් පාලන ආයතනයට ගෙවනු ලබන බදු වලට අමතරව, කසල දොරින් දොරට එකතු කිරීමේ වියදම් පියවා ගැනීම සඳහා එහි 1 වන උපලේඛණයේ ඇති භාවිත ගාස්තු,

(ආ) රීති අංක 09 අනුව එහි 3 උපලේඛණයේ දැක්වෙන පරිදි අපද්‍රව්‍ය ප්‍රමාණය මත ගාස්තු,

(ඇ) රීති අංක 20 අනුව ඉදිකිරීම් අපද්‍රව්‍ය කැබලි හා සුන්බුන් එකතු කිරීම් සඳහා අයකල යුතු ගාස්තු,

(ඈ) රීති අංක 21 අනුව ස්ථාන දඩ

---

**2.4** තොග පාලනය

-----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිකුත් කර තිබූ තොග, තොග ලේඛණයේ සටහන් කර නොතිබුණි.

(ආ) තොග අවශ්‍යතාවයන් පිළිබඳ හා ඉතිරි තොග පිළිබඳ නිස සැලකිල්ලකින් තොරව තොග මිළදී ගැනීම නිසා වර්ෂ 2 හා 5 අතර කාලයක් තුල පිළිවෙලින් රු.86,351 හා රු.412,523 ක වටිනාකමැති තොග නිකුත් නොවී නිශ්කාර්යව පැවතුණි.

**2.5** අයවීමට ඇති සේවක ණය

-----------------------------

සේවය හැර ගිය හා මියගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.55,314 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.6 මහජන සෞඛ්‍ය පීඩා වැලැක්වීම

---------------------------------

2012 ජුනි 27 දිනැති අංක 1764/14 ගැසට් පත්‍රයේ පළකර ඇති 2012 අංක 03 දරන මහජන සෞඛ්‍ය පීඩා වැලැක්වීමේ ප්‍රඥප්තිය ප්‍රකාරව, බසනාහිර පළාතේ මහජන සෞඛ්‍ය නගා සිටුවීම සහ සංරක්ෂණය කිරීම සඳහාත්, මදුරුවන් මගින් ඇතිවන පීඩා සහ රෝග වැලැක්වීම සඳහාත්, අනෙකුත් මහජන පීඩා මැඩ පැවැත්වීම සඳහාත් ඊට සම්බන්ධ හෝ අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සලසා නොතිබුණි.

**2.7** සංයුක්ත සැලැස්ම

-------------------

2003 ජුනි 02 දිනැති පීඊඞී/12 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ අංක 05 ඡේදය ප්‍රකාරව සභාවේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා සිව් අවුරුදු සැලැස්මක් පිළියෙල කිරීමේදී අනුගමනය කළයුතු පහත සඳහන් නිර්නායකයන් සැලකිල්ලට භාජනය කර නොතිබුණි.

(අ) පසුගිය වර්ෂ 05 ක මෙහෙයුම් කටයුත

(ආ) වාර්ෂිකව ඉටුකර ගතයුතු කාර්යයන්ගේ ප්‍රමාණය

(ඇ) මුල්‍යාමය ඇස්තමේන්තු

(ඈ) සමහර අංශ සඳහා ඉදිරි වර්ෂ වෙනුවෙන් ඉලක්කයන්

(ඉ) සිව් අවුරුදු කාලය තුල වාර්ෂික ඉලක්කවල විවිධත්වය.

---

**2.8** අභ්‍යන්තර විගණනය

------------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් **පද්ධති හා පාලන** ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය **යොමු කරනු ලැබේ.**

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) අයවැය පාලනය

(ඈ) ආදායම් පරිපාලන

(ඉ) වත්කම් කළමනාකරණය

(ඊ) වාහන පාලනය